# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021
### 2024 සැප්තැම්බර්

### සමාජීය විද්‍යා පීඨය

### ජනසන්නිවේදනය

### නිර්මාණාත්මක සන්නිවේදනය හා විචාර අධ්‍යයනය MACO–E 3025

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දෛනික ජීවිතයේ සන්නිවේදන කාර්ය නිර්මාණාත්මකව සිදුකිරීමෙන් අත්කර ගතහැකි ප්‍රතිලාභ මොනවාදැයි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. ජන සාහිත්‍ය තුළ දැකිය හැකි නිර්මාණාත්මක ලක්ෂණ උදාහරණ ඇසුරින් පහදන්න. (ලකුණු 20)

03. ගුවන්විදුලි නාට්‍යය නිර්මාණාත්මක වැඩසටහන් ආකෘතියකි. පිටපත් රචනය, හඬනළුව, සහ සංස්කරණය යන අදියරවලට විශේෂිතව උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 20)

04. සිනමාව තුළ භාවිත නව තාක්ෂණික ක්‍රමෝපාය නිර්මාණශීලීව යොදාගත් අවස්ථා උදාහරණ සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. ''පශ්චාත් යටත්විජිතවාදී ලේඛකයන්ගේ අරමුණ වූයේ යටත්විජිතවාදය හේතුවෙන් ආසියානු අප්‍රිකානු රටවල ජනතාව මුහුණදුන් සමාජ සංස්කෘතික සම්පර්කය ගැඹුරු ලෙස විග්‍රහ කිරීමයි.'' පශ්චාත් යටත්විජිත ලේඛකයන් තිදෙනෙකුගේ සාහිත්‍ය රචනා ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. ''ස්ත්‍රිය මාධ්‍ය විසින් නිරූපණය කරන ආකාරය පිළිබඳ ස්ත්‍රීවාදී විචාරයේදී අවධානය යොමු කරනු ලැබේ.'' රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් උදාහරණයට ගනිමින් විචාරය කරන්න. (ලකුණු 20)

07. සංස්කෘතික ගැටුම් අවම කර ගැනීම සඳහා ග්‍රාහකයා කෙරෙහි අන්තර් සංස්කෘතික අවබෝධය වැඩිදියුණු කිරීමට සමාජ මාධ්‍ය භාවිත කළ හැකි ආකාරය සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 20)

08. මාතෘකා දෙකක් (02) පිළිබඳ සටහන් ලියන්න.

    1. ලාංකීය සම්භාව්‍ය පද්‍ය සහ නිර්මාණාත්මක ලක්ෂණ
    2 නිර්මාණාත්මක රචනය
    3. නිර්මාණකරුවා
    4. මාධ්‍ය පර්යේෂණ හා නිර්මාණාත්මක සංදේශ

(ලකුණු 10x2 = 20)

**********************************